# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1866/37 - 2014 ජුනි මස 13 වැනි සිකුරාදා - 2014.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 3/3/2/81.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/12/2013/D/43.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුව සුළු කොට්ඨාසයේ, කලුමුතුකැටියවත්ත යන ගමේ මැනුම්පති විසින් පිළියෙළ කර ඇති අංක 9416 සහ 2014.04.09 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01, 02 සහ 03 වශයෙන් සඳහන් කර ඇති මුළු ප්‍රමාණයෙන් පිළිවෙලින් හෙක්. 1.2141,0.0585 සහ 1.1555ක්වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි (03) ට මායිම්;

**කැබලි අංක 1**

ඉඩමේ නම: කලුමුතුකැටියවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: ඊ. ප්‍රේමසිරි මහතා සහ ඉන්ද්‍රාණි රමාලතා මහත්මිය, අංක 399/2, උඩගෙවත්ත, මීගොඩ; ප්‍රමාණය: හෙක්. 1.2141.

**කැබලි අංක 2**

ඉඩමේ නම: කලුමුතුකැටියවත්ත; විස්තරය: ප්‍රවේශ මාර්ගය; හිමිකම් කියන අය: මොරගොඩගේ අරුණ ප්‍රියංකර මහතා, අංක 547/1, වැවහේන පාර, රන්මුතුගල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0585.

**කැබලි අංක 3**

ඉඩමේ නම: කලුමුතුකැටියවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: මොරගොඩගේ අරුණ ප්‍රියංකර මහතා, අංක 547/1, වැවහේන පාර, රන්මුතුගල, කඩවත ; ප්‍රමාණය: හෙක්. 1.1555

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 අගෝස්තු මස 21 වැනි දින පූ. භා. 10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 අගෝස්තු මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ජී. එස්. කේ. කන්නන්ගර,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2014 ජුනි මස 09 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 813

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : නුඑ/3/1/8/අත්පත්/160.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/10/2013/යූඩීඒ/639.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර


1A - G 19719 - 20 - (2014/06)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ (කොට්ටාස අංක 07 පාක් රෝඩ්-නුවරඑළිය මහ නගර සභාව සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක නු1840 හා 1996.11.30 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 සිට 3 ලෙස පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.0271ක් පමණ වන ඉඩම් කොටස්වලට මායිම්,

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: ඕක්ලි කොටේජ්; විස්තරය: ස්ථිර ගොඩනැගිල්ලක් සහ සයිප්‍රස්, ඇකේෂියා, ටර්පන්ටයින් ගස් ඇත; හිමිකම් කියන අය: කෙල්සි ප්‍රොපටි ඩිවලපර්ස්, දූනෙම්ස් කැපිටල් පීඑල්සී සහ නෙක්ස්වෙන්වස් ලිමිටඩ්;ප්‍රමාණය: හෙක්ටයාර් 5.2639

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: ඕක්ලි කොටේජ්; විස්තරය: ස්ථිර ගොඩනැගිල්ලක් සහ සයිප්‍රස්, ඇකේෂියා, ටර්පන්ටයින් ගස් ඇත; හිමිකම් කියන අය: කෙල්සි ප්‍රොපටි ඩිවලපර්ස්, දූනෙම්ස් කැපිටල් පීඑල්සී සහ නෙක්ස්වෙන්වස් ලිමිටඩ්;ප්‍රමාණය: හෙක්ටයාර් 0.6542

03. **කැබලි අංක 03**

ඉඩමේ නම: ඕක්ලි කොටේජ්; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: කෙල්සි ප්‍රොපටි ඩිවලපර්ස්, දූනෙම්ස් කැපිටල් පීඑල්සී සහ නෙක්ස්වෙන්වස් ලිමිටඩ්;ප්‍රමාණය: හෙක්ටයාර් 0.1090

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන්ගේ හෝ 2014 ජූලි මස 04 වැනි දින පෙ. ව. 10.30 ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 ජූනි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2014 ජූනි මස 10 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 814

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.